යම් ජන සමාජයක භාවිතා වන භාෂාව ඔස්සේ, එම ජන සමාජයේ චින්තනය හා ආකල්පද හැඩ ගැසෙනා බව පැවසෙන කරුණකි. මේ නිසාම, මාධ්‍ය විසින් තමන් භාවිතා කරනා භාෂාව සම්බන්ධයෙන් වරක් දෙවරක් නොව තෙවරක් සිතාබැලීම වටී.

එයට උදාහරණයක් ලෙසට 'කුඩ්ඩා', 'මත්ලෝලියා', 'හෙරොයින් ලෝලියා' වැනි යෙදුම් දැක්විය හැක. කුඩ්ඩා යන යෙදුම හා බැඳී ඇති ගර්හාත්මක සහ නිෂේධනාත්මක අර්ථය සමගින්, මත්ද්‍රව්‍ය ඇබ්බැහියකින් යුක්ත වූ අයෙකුට පුනරුත්ථාපනය ඔස්සේ හෝ නැවත සමාජයට ඇතුළත් වීමට ඇති ඉඩ ඇහිරීමක් සිදු නොවන්නේද? එවැනි යෙදුම් ශිෂ්ට සම්පන්න සමාජයකට යෝග්‍ය වන්නේද? එසේම මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු සංකීර්ණ කරුණු සමුදායක් විනා, සරල මත්ද්‍රව්‍ය සඳහා ලොල් වීමක් නොවන බැවින්, 'මත්ලෝලියා', 'හෙරොයින් ලෝලියා' වැනි යෙදුම් ගැටළුකාරී නොවන්නේද?
**#MediaEthicsSL #lka #SinhalaPress #Diivaina #Lankadeepa #Mawbima**